# කොවිඩ් 19 සති පාසල - සබරගමුව

(නිවිතිගල අධ්‍යාපන කලාපය)

විෂය -විද්‍යාව ශ්‍රේණිය-09 සතිය 08

## ස්වයං අධ්‍යයන පත්‍රිකාව 08

## මාතෘකාව-සරල යන්ත්‍ර

පාඩම- කප්පි

*මෙම අධ්‍යයනය අවසානයේ දී ඔබ

- අචල කප්පි සරල යන්ත්‍රයක් බව ක්‍රියාකාරකමක් මඟින් පහදයි.
- කාර්යය පහසු කර ගැනීම සඳහා අචල කප්පි මෙන් ඇඳූ සචල කප්පි යොදා ගන්නා ආකාර ආදර්ශණය කරයි.
- කප්පි පද්ධති වල භාවිත අවස්ථා සඳහන් කරයි.
- සංකීර්ණ යන්ත්‍ර නිර්මාණය වී ඇත්තේ සරල යන්ත්‍ර ගණනාවක් එක්වීමෙන් බව සුදුසු යන්ත්‍රයක් භාවිතයෙන් ආදර්ශනය කරයි.
- සුව පහසු දිවියක් සඳහා ඉවහල් වන තාක්ෂණ දියුණුවට අදාල යන්ත්‍ර වල දායකත්වය අගයයි.

*පළමුව 9 ශ්‍රේණියේ පෙළ පොතේ II කොටස හි 97 වන පිටුව කීපවරක් කියවන්න.එහි 15.3 ක්‍රියාකාරකම සිදු කරන්න.

*පහත ප්‍රශ්න ඉදිරියේ හරි වැරදි ලකුණු කරන්න.

1. යමක් කෙලින් එසවීමේදී බලය යෙදිය යුත්තේ ඉහළටයි. ( )
2. කප්පි යොදා ගැනීමේදී තන්තුව පහසු දිශාවකට පවත්වා ගෙන පහසු ආනතියකට බලය යෙදීම පහසුය. ( )
3. ඉහළට බලය යොදනවාට වඩා පහළට බලය යෙදීම පහසුය ( )
4. කප්පියක් භාවිතයෙන් බරක් එසවීමට පහසුය. ( )

*දැන්, 98 පිටුව කියවා සරල යන්ත්‍ර ආශ්‍රිත සරල ගැටලු විසඳන ආකාරය කොටස් VI කින් යුතු ගැටලු විසඳා හුරු වන්න.

*ඉන්පසු 99 පිටුව කීපවරක් කියවන්න.

I. 15.24 රූපය ඇඳ කොටස් නම් කරන්න.
II. කප්පි දෙකක් ලබා ගෙන ( ආදේශක භාවිතා කරන්න.)15.24 ලෙස තන්තු කප්පිය තුලින් යවා භාරයක් (බරක්) එසවීමට උත්සාහ ගන්න.
III. ප්‍රවේග අනුපාතය කප්පි වලදී යෙදෙන ආකාරය වටහා ගන්න.(99 පිටුවේ 3වන ඡේදය අනුව)
IV. අචල සහ සචල කප්පි සහිත යන්ත්‍ර (ස්ථාන) නම් කරන්න

*පිටු අංක 100 කියවා එහි පාපැදිය වැනි සරල යන්ත්‍ර කීපයක් එක් වී සෑදී ඇති යන්ත්‍ර කීපයක් නම් කරන්න.

*අමතර ක්‍රියාකරකමක් ලෙස පිටු අංක 101,102 ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.